# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව විකාශය හා දරිද්‍රතාව මැනීම

ඩී.එම්. තිලිනි මදුමාලි දිසානායක[1]

**සංක්ෂිප්තය**

1998 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්වචනය කරන පරිදි දරිද්‍රතාව යනු " පුද්ගලයන්ට නැතහොත් පවුල් ඒකකයන්ට සමාජය තුළ යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සේ සලකනු ලබන භාණ්ඩ හා සේවා ලබා ගැනීමට ඇති නොහැකියාවයි" එනම් දළ වශයෙන් අවම ජීවන තත්ත්වයක් ළඟා කර ගැනීමට අවශ්‍ය මනා පෝෂණයක් නොලැබීම සම්පත් හිඟය ආදිය වේ. වර්තමානය වන විට ලෝකයේ බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් මෙන් ශ්‍රී ලංකාව ද සමාජීය හා ආර්ථික වශයෙන් මුහුණ දෙන ප්‍රධානම ගැටළුවකි දරිද්‍රතාව. මේ නිසා නිදහස ලැබූ අවධියේ සිට ම ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ සහ සංවර්ධන පර්යේෂකයන්ගේ අවධානය යොමු වුව ද දිළිඳුකම පිළිබඳ ගැටලුව තවමත් ශ්‍රී ලංකාවේ සැලකිය යුතු ගැටලුවක් පවතී. ඒ අනුව මෙම ලිපිය මගින් අපේක්ෂා කරනුයේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අතීතයේ පැවති තත්ත්වය හා එහි වර්තමාන ස්වරූපය හඳුනා ගැනීමත්, දරිද්‍රතාව මැනීම උදෙසා ශ්‍රී ලංකාවේ භාවිත කරන ක්‍රම හා ඒවායේ යෝග්‍යතාව පිළිබඳ හඳුනා ගැනීමත් ය. මෙහි දී පොත්පත් සඟරා ආයතනික සංඛ්‍යා ලේඛන ආදී ද්විතීක මූලාශ්‍ර යොදාගෙන ඇත.

**මුඛ්‍ය පද:** දරිද්‍රතාව, මිනුම්, සංවර්ධනය, ජනගහණය

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ පසුබිම පිළිබඳ සොයා බැලීමේ දී අතීතයේ සිට වර්තමානය දක්වා දරිද්‍රතාවේ ස්වරූපය විමසා බැලිය හැකි ය. 18 සහ 19 වැනි ශතවර්ෂවල ලේඛකයින්ගේ ප්‍රමාණික වාර්තාවල සඳහන් වූයේ පැරණි ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජීවිතයේ විශේෂයෙන් ම ඉතාම දුර බැහැර දිස්ත්‍රික්කවල ග්‍රාමීය ජීවිතයේ මූලික ලක්ෂණය වූයේ නිදන්ගත දිළිඳුකම බව ය. උදාහරණයක් වශයෙන් ග්‍රාමීය ජනයාගේ ආහාර අහේනිය, පොදුවේ අයහපත් සනීපාරක්ෂණ පහසුකම්, පසෙන් සහ ජලයෙන් ඇතිවන රෝග සහ මිනිසා විසින් නිර්මිත මෙන් ම ස්වභාවිකව ඇතිවන ව්‍යසනවලින් නිරන්තරයෙන් එල්ල වන බාධා යන මේවායින් ඇතිවන පීඩා වින්දාහ (වික්‍රමසිංහ, 1924 ; වුල්ෆ්, 1926). 1950 ගණන්වලට පෙර කාලය තුළ ශ්‍රී ලංකාවේ දිළිඳුකමේ මූලික හේතු විවාදාත්මක ය. ලංකාවේ ග්‍රාමීය අංශය තුළ දිළිඳුකම පැවතුණේ ඉඩම් හිමියන් ග්‍රාමීය නිලධාරීන් සහ වෙළෙඳුන් විසින් ග්‍රාමීය ජනතාවගේ බහුතරය සූරාකනු ලැබීම තුළ ය. මේ බව වුල්ෆ් සහ දාස්ගුප්ත (1946) අනාවරණය කළහ (තෙන්නකෝන්, 2003). 1980 දශකය මැද භාගය පමණ වන විට දුප්පත් සහ

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යා තෙවන වසර, tmsan1989@gmail.com

පොහොසත් දෙකොට්ඨාසය අතර පරතරය පුළුල් විය. ජීවන රටාව අනුව මේ කණ්ඩායම් දෙක අතර කෙතරම් පරතරයක් තිබේද යන්න මිනිසුන් අවබෝධ කර ගැනීමත් සමගම සාමාන්‍ය මිනිසුන්ගේ දැනුවත්කම වැඩි විය. දරිද්‍රතාව සමග විශාල ලෙස ආදායම බෙදීයාමේ පරතරය වැඩිවීම, රැකියා වියුක්තිය වැඩිවීම, යනාදිය ද රටේ ප්‍රධානම ගැටළු බවට පත්විය. ඒ අනුව 1997 වර්ෂය අවසානය වන විට ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය දශලක්ෂ 62 ක් වූ අතර ඉන් 10.4% ක් සේවා වියුක්තිකයන් ය (ආර්ථික විද්‍යා අර්ධ වාර්ෂික අධ්‍යාපන සංග්‍රහය, 2000).

1999/2000 ශ්‍රී ලංකා ඒකාබද්ධ සමීක්ෂණයේ දී සියයට 25.3 ක් වශයෙන් ශ්‍රී ලංකා ජනගහණයෙන් හතරෙන් එකකට වඩා දරිද්‍රතා රේඛාවට පහළ මට්ටමේ ජනතාවක් වෙසෙන බවට ඇස්තමේන්තු කර ඇත. තව ද දරිද්‍රතා රේඛාව දිනක ඒක පුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් එකක් ලෙස සැලකූ විට (මිලදී ගැනීමේ ශක්තියේ සමානකම හා ගලපනවිට) ශ්‍රී ලංකා ජනගහණයෙන් දිළිඳු අය ඇත්තේ සියයට 7 කි. නමුත් එය ඇමරිකානු ඩොලර් දෙකක් ලෙස ගත් කළ දිළිඳු ජනගහණය සියයට 45 කි. මෙයින් පෙන්නුම් කරන්නේ ජනගහණයෙන් හතරෙන් එකේ සිය මූලික අවශ්‍යතා සපුරා ගැනීමට තරම් ප්‍රමාණවත් ආදායමක් නොලබන බවයි (සිද්ධියේන හා ජයතිලක, 2003).

නවතම වාර්තා අනුව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2015 නිකුත් කළ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය (2012/2013) HIES වාර්තාව මගින් අනාවරණය වූ කරුණක් වූයේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවෙන් යුතු කුටුම්භ ප්‍රතිශතය 5.3% වන බව ය. නමුත් එය පෙර වර්ෂවලට වඩා පහළ මට්ටමක පැවතිය ද රටේ සංවර්ධන ක්‍රියාවලියට තීරණාත්මක බලපෑමක් සිදු කරන බව ලොව පිළිගත් කරුණකි. එය වඩාත් තහවුරු වන්නේ 2015 වන විට ජයගත යුතු සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථයන් ලෙස ලෝකයේ දරිද්‍රතාව හරි අඩකින් අඩු කිරීම පිළිගෙන තිබීම ය. 2014 ශ්‍රී ලංකා මහබැංකු වාර්ථාව පෙන්වා දෙන පරිදි 2006/2007 වසරේ දරිද්‍රතා දර්ශකය (poverty Index) 15.2% වුවත් එය 2012/2013 වසරේදී 6.7% දක්වා අඩුවීම තුළ ඒ මගින් පෙන්නුම් කරන්නේ ඒ සඳහා ලංකාවේ ක්‍රියාකාරී මැදිහත්වීම සහ ඉදිරිදැක්ම ය (මල්කාන්ති, 2015).

කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ ආදායම් බෙදියාමේ විශමතාව, සේවා වියුක්තිය හා ධනවත් රටවල් මත යැපෙන යැපුම් ආර්ථික පැවතීම යනාදී හේතු සාධක නිසාවෙන් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මූලික ම සමාජ ගැටලුවක්ව පවතී. මේ නිසාවෙන් මෙකී දරිද්‍රතාව තුරන් කිරීම හා මානව සම්පත් සංවර්ධනය සඳහා ගත් උත්සහය පිළිබඳව ඉතිහාසය ගැඹුරින් විශ්ලේෂණය කිරීමේදී ප්‍රධාන ක්‍රමෝපායන් දෙකක් කෙරෙහි විශේෂ අවදානය යොමු කර ඇති බව දැක ගත හැකි ය.

i. මානව සම්පත් සංවර්ධනය
ii. සමාජ සුභසාධනය අරමුණ කරගත් වැඩසටහන් වශයෙනි.
(ග්‍රාම සංවර්ධන හා පර්යේෂණ ආයතනය 1998)

මේ අනුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අතීතය තුළ තිබූ තත්ත්වය හා වර්තමානය තුළ පවතින ආකාරය පිළිබඳව වූ ඉහත වාර්තාවලට අනුව දරිද්‍රතාවේ අඩුවීමක් එම

දර්ශක තුළ දක්නට ලැබේ. එසේ ම දරිද්‍රතාවය පිළිබඳ එය තුරන් කිරීම උදෙසා පෙර සඳහන් කළ පරිදි ආකාරයන් දෙකකින් ගත් ක්‍රියා මාර්ග තුළ එම ක්‍රියාවලිය විමර්ශනය ඉතා වැදගත් බව දක්නට ලැබේ. 20 වන සියවස දෙවන භාගයේ සිට ක්‍රියාත්මක වු ඇතැම් සුභසාධක ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ මෙම ප්‍රතිපත්ති මගින් රටේ ඇති වු ආර්ථික දියුණුව වෙනත් දියුණු රටවල් සසඳන විට දී ඉහළ අගයක් ගනී.

2015 ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්තවලට අනුව මානුෂීය සංවර්ධනය පිළිබඳ මිනුම් දඩු උපයෝගී කරගෙන ශ්‍රී ලංකාවේ මානුෂික සංවර්ධන අංකය 2013 වර්ෂය වන විට 0.750 ක් වෙයි. ඉන්දියාවේ පවා මෙම අගය 0.586 ක් පමණි. බොහෝ අඩු දියුණු රටවල මෙය 0.336 ක් සහ කාර්මික රටවල 0.911 ක් වේ. ලෝකේ රටවල් 75 න් ශ්‍රී ලංකාව 91 වෙනි තැන ගනියි. මෙම දර්ශකය ගණනය කිරීම සඳහා භාවිතා කරන ලද විචලයක් වන්නේ ආයු අපේක්ෂාව, වැඩිහිටියන්ගේ අකුරු හැකියාව, ප්‍රාථමික සහ ද්විතික අධ්‍යාපන තත්වය,  ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය යි.

මෙසේ මානව සංවර්ධනය ඉහළ යාමට හේතුව වූයේ රජය විසින් පුළුල් පාසල් පද්ධතියක් මගින් පවත්වාගෙන ගිය නිදහස් අධ්‍යාපන ක්‍රමය, මිනිසුන්ට සේවා ලබා ගැනීමට පහසු වන ලෙස සෞඛ්‍ය සේවාව මගින් නිදහස් ප්‍රජා සෞඛ්‍ය ක්‍රමයක් පවත්වාගෙන යාම, ආහාර සහනාදාර යනාදිය ලබා දීමයි. මේ මගින් රටේ අධ්‍යාපනය සහ සෞඛ්‍ය සම්බන්ධ දර්ශක වල වැඩිවීම් ඇති විය. එමනිසා රටවල් අතර ඒක පුද්ගල ආදායම හා සුභසාධන දර්ශක අතර ඇති සම්බන්දතාව විමසීමේ දී ශ්‍රී ලංකාව උසුලනුයේ සුවිශේෂි ස්ථානයකි. නමුත් මෙම සමාජ ප්‍රතිලාභ ලබා ගන්නා ලද්දේ රාජ්‍ය අයවැය මගිනි (ලක්ෂමන්, 1998).

### ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව වර්තමාන ස්වභාවය

2014 වර්ෂය වන විට ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව නිල දරිද්‍රතා රේඛාව මත පදනම් වූ දරිද්‍රතා දර්ශකය 2012/2013 වසරේදී සියයට 6.7 ක් ලෙස වාර්තා වී ඇත. ප්‍රාදේශීය වශයෙන් පවතින දැඩි විශමතාවක් පෙන්නුම් කරමින් අවම දරිද්‍රතා මට්ටම සියයට 1.4 කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර, මුලතිව් දිස්ත්‍රික්කය සියයට 28.8 ක් වූ ඉහළ ම දරිද්‍රතා අගය සටහන් කර ඇත. නාගරික අංශය අවම දරිද්‍රතා  මට්ටම සටහන් කරමින් සියයට 2.1 ක පැවති අතර, වතු හා ග්‍රාමීය අංශවල දරිද්‍රතා මට්ටම පිළිවෙලින් සියයට 10.9 ක් හා 7.6 ක් විය.

වගුව 1 : ශ්‍රී ලංකාවේ අංශ අනුව දුගී ජනගහණය

| | නාගරික | ග්‍රාමීය | වතු |
|---|---|---|---|
| 2006/2007 | 6.7 | 15.7 | 32.0 |
| 2009/2010 | 5.3 | 9.4 | 11.4 |
| 2012/2013 | 2.1 | 7.6 | 10.9 |

මූලාශය :- ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2015

එසේම ගෘහ ඒකක ආදායම මත පදනම්ව නිර්ණය කරන ගිනි සංගුණකය 2009/10 පැවති 0.49 ට සාපේක්ෂව 2012/13 වසරේ දී 0.48 ක් ලෙස පැවති අතර, ගෘහ ඒකක වියදම මත පදනම්ව නිර්ණය කරන ගිනි සංගුණකය 2009/10 පැවති 0.37 ට සාපේක්ෂව 2012/13 වසරේදී 0.40 ලෙස වාර්තා වී ඇත (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2014). මෙහි දී ආදායම් මත පදනම් වූ ගිනි සංගුණකයේ අගය 2012/13 වර්ෂය වන විටත් 0.48 ක අගයක් සටහන් එම තුළ නිරූපනය වන්නේ ශ්‍රී ලංකාව තුළ තවමත් විශාළ ලෙස ආදායම් බෙදීයාමේ විශමතාවයක් පවතින බව ය.

ආදායම් අසමානතාවය වර්ධනය නොවුයේ නම්, ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව 5% කට වඩා වැඩි අගයකින් පහළ දැමීමට හැකිවන ඇති බව ද, ඒ අනුව ශ්‍රී ලංකාවේ ඉතා ඉහළ ආදායම් දරිද්‍රතා අනුපාතයේ අගයක් පවතින බවත්, එය දකුණු ආසියානු අනෙකුත් රටවලට සාපේක්ෂව පහළ අගයක් වුව ද, ආදායම් අසමානතාව ගත් කළ එය දකුණු ආසියා කලාපීය රටවලට සාපේක්ෂව ඉහළ අගයක් පවතින බව 2007 ලෝක බැංකු වාර්තාවේ ඉදිරිපත් කොට ඇත.

**ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිළිබඳ මිනුම්.**

බොහෝ රටවල මෙන් ශ්‍රී ලංකාවේ ද දරිද්‍රතාව සහ එහි ගැඹුර ඇස්තමේන්තු කිරීම සඳහා ආහාර සහ ආහාර නොවන අවශ්‍යතා සඳහා වැය කිරීමේ සාධකය පදනම් කරගෙන දරිද්‍රතා ආදායම් මට්ටම තීරණය කරයි. දරිද්‍රතාව පිළිබඳ ඇස්තමේන්තු කිරීමේදී මූලික අවශ්‍යතා සහ දරිද්‍රතාවේ බහුමාන අංශයන් පිළිබඳව අවම ලෙස සැලකිල්ල යොමු කර ඇත. දරිද්‍රතා විශ්ලේෂණය මට්ටම් දෙකක දී සිදු කරයි. එනම් දරිද්‍රතාව නිර්වචනය කිරීම එය මැනීම වශයෙනි. දරිද්‍රතාව නිර්වචනය කිරීමේ දී එය සංකල්පමය වශයෙන් ගොඩනගාගෙන එමඟින් මිනිසුන් දිළිදු හෝ දිළිදු නොවන වශයෙන් හඳුනා ගනී. දරිද්‍රතාව මැනීමේ නිර්වචනය අනුව දරිද්‍රතාවයේ ප්‍රමාණය එක් සංඛ්‍යාමය දත්තයක් ලෙස ගණනය කරයි (මායාදුන්නේ සහ රොමේෂන්, 2013).

දරිද්‍රතාව ඇස්තමේන්තු කිරීමට බොහෝමයක් අවස්ථාවලදී ශ්‍රී ලංකාවේ මිනුම් ක්‍රමයක් ලෙස යොදා ගන්නේ මූල්‍ය මිනුම් ක්‍රමය යි. මූල්‍යමය ප්‍රවේශයේ දී දරිද්‍රතාව යන්න දරිද්‍රතා රේඛාවට අදාළව ආදායම් හෝ පරිභෝජනයේ ඇතිවන හිඟයක් ලෙස විග්‍රහ වන අතර මෙහි දී ආදායම සහ වියදම පිළිබඳ මිනුම් අවධානයට යොමු කරගනු ලබයි. මෙම ප්‍රවේශයට අනුව දරිද්‍රතාව යනු පිළිගත හැකි මට්ටමේ යහපැවැත්මක් පවත්වා ගැනීම සඳහා වූ අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් නොමැතිවීම

හෝ ඒවා ලබා ගැනීමට නොහැකිවීම යි (අලයිලිමා, 2007). මෙම ප්‍රවේශයේ දී ප්‍රමාණාත්මක දත්ත එක්රැස් කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ ක්‍රම භාවිතා කරනු ලබන අතර නිරපේක්‍ෂ සහ සාපේක්‍ෂ මිනුම් උපයෝගී කරගනු ලැබේ.

මෙහි දී නිරපේක්ෂ මිනුමක් වශයෙන් නිරපේක්ෂ දරිද්‍රතා රේඛාව යනු කිසියම් කුටුම්භයක මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍යවන සම්මත භාණ්ඩ හා සේවාවන් ප්‍රමාණයක් පදනම් කරගෙන නිරපේක්ෂ දරිද්‍රතාව මැනීම යි. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2002 වසරේ පරිභෝජන දත්ත උපයෝගී කරගෙන නිල වශයෙන් ජාතික දරිද්‍රතා රේඛාව ප්‍රකාශයට පත් කෙරුණි. මේ දරිද්‍රතා රේඛාව සකස් කරන ලද්දේ මූලික අවශ්‍යතා සඳහා යන වියදම් ක්‍රමය පදනම් කරගෙන යි.

මෙසේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිළිබඳව අධ්‍යයන වැඩි ප්‍රමාණයක දී අවධානය යොමු කරන්නේ නිරපේක්ෂ දරිද්‍රතාවය පිළිබඳ වුවත්, ශ්‍රී ලාංකික සන්ධර්භයේ සාපේක්ෂ දරිද්‍රතාව පිළිබඳ වැදගත්කම ඉහළ යමින් තිබේ. සාපේක්ෂ දරිද්‍රතාව යනුවෙන් හැඳින්වෙන්නේ ජාතික මට්ටමේ සාමාන්‍යයේ යම් ප්‍රතිශතයට වඩා ආදායම හෝ පරිභෝජන මට්ටම්වල අඩු බවක් පැවතීම ය. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ දරිද්‍රතාව මැනීම සඳහා වඩා හොඳ මිනුම් වශයෙන්

- ගිනි සංගුණකය
- ඒක පුද්ගල ආදායම ආදායම් දශමකයට අනුව
- කුටුම්බයක වියදම වියදම් දශමකයට අනුව

(ජබ්බාර්, 2014).

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැනීම උදෙසා යොදා ගන්නා මූල්‍යමය නොවන ප්‍රවේශයන් සහ මිනුම් පිළිබඳ සැලකීමේ දී විශ්වීය මට්ටමින් පිළිගැනීමට ලක්ව පවතින මානව සංවර්ධන දර්ශනය හා මානව දරිද්‍රතා දර්ශකය යොදා ගන්නා බව දැක්විය හැකි ය. ශ්‍රී ලංකාව යොදා ගන්නේ සම්මත මානව සංවර්ධන දර්ශකය යි. එහි දී අවධානය යොමු කරනුයේ ලඟා කරගත් මට්ටම් වෙතට ය. කෙසේ වුව ද මානව දරිද්‍රතා දර්ශකය ඇතැම් දර්ශක යොදා ගනිමින් නවීකරණය කර ඇති අතර මෙමගින් සන්ධර්භයේ මානව දරිද්‍රතාව හොඳින් හඳුනාගැනීමට සමත් වේ (UNDP 2013).

එසේ ම ශ්‍රී ලංකාවේ සිදුකරන ලද සමීක්ෂණවල දත්ත උපයෝගී කරගෙන ශ්‍රී ලංකාවේ බහුමානයන්ගෙන් යුත් සංකීර්ණ දරිද්‍රතාව සම්බන්ධයෙන් බහුවිධ නිර්ණායකයන් ගණනය කිරීම සඳහා උත්සහ දරන අවස්ථා දක්නට ලැබේ. 2004 දී සිද්ධිසේන හා ජයතිලක පෝෂණය, ප්‍රාථමික අධ්‍යාපනය, සෞඛ්‍ය සත්කාර, සනීපාරක්ෂාව, බීමට සුදුසු ජල, නිවාස තත්ත්වය, සහ ආදායම යන සාධක බහුවිධ සංයුක්ත දර්ශනය සැකසීමට යොදා ගන්නා ලදී. තව ද දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය බහුමාන දරිද්‍රතාව පිළිබඳ සංයුක්ත දර්ශක ගණනය කිරීමට ප්‍රයත්ත දරා තිබේ. මායාදුන්නේ හා රොමේෂන් 2011 දී කොළඹ නගරයේ තෝරා ගත් භූමි ප්‍රදේශයක බහුමාන දරිද්‍රතාව පිළිබඳ සංයුක්ත දර්ශක ගණනය කිරීමට ඇති හැකියාව සොයාබලා ඇත.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැනීම සඳහා සමාජයෙන් කොන් කිරීමේ/බැහැර කිරීමේ ප්‍රවේශය උපයෝගී කරගැනීමේ දී කණ්ඩායම් ප්‍රවේශයක් යොදාගනු ලබයි. උදාහරණයක් වශයෙන් මෙහි දී මෙම කණ්ඩායම සමාජයෙන් බැහැර කරන ලද සේ සලකනු ලබයි. සහභාගීත්ව ප්‍රවේශය දරිද්‍රතාව පිළිබඳ බහුමාන දර්ශක ගොඩනැගීම සඳහා වූ මානයන් හඳුනාගැනීමට සහ දරිද්‍රතාවේ ගතික ක්‍රියාවලිය හඳුනා ගැනීමට යොදා ගනු ලබයි (ගුණවර්ධන, 2005).

**ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැනීමේදී භාවිතා වන මිනුම්වල යෝග්‍යතාව**

මෙලෙස ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැනීමේ දී භාවිතා වන විවිධ මිනුම්වල යෝග්‍යතාව පරීක්ෂා කිරීමේදී නිල දරිද්‍රතා රේඛාව ආදී මිනුම් තුළින් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව සමස්ථ වශයෙන් හා ආංශික වශයෙන් මෙන් ම පලාත් වශයෙන් මැනීමේ හැකියාව තුළ දරිද්‍රතාවේ ව්‍යාප්තිය හඳුනා ගත හැකි ය. ඒ තුළ ආංශික වශයෙන් දරිද්‍රතාව පැවතීමට හේතු සාධක සොයා බැලීමට හැකියාව ලැබෙන අතර, දිස්ත්‍රික්ක වශයෙන් ඉහත සඳහන් පරිදි විශාළ වශයෙන් පරතරයක් දරිද්‍රතාව තුළ නිර්මාණය විමට පාදක වූ කරුණු විමර්ශනය කළ හැකි ය.

එසේ ම මානව සංවර්ධනය දර්ශකය ආදී දර්ශක යොදා ගැනීම නිසා ලොව සෙසු සංවර්ධනය වෙමින් පවතින රටවලට වඩා ශ්‍රී ලංකාවේ මානුෂිය සංවර්ධන අංකය ඉහල අගයක් නිරූපණය වීම තුළ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ජීවන තත්ත්වයන් සම්බන්ධයෙන් ළගා කරගෙන ඇති උසස් මට්ටම හඳුනා ගත හැකි ය. එසේ ම මානව සංවර්ධනය වර්ධනය කර ගැනීම උදෙසා පවතින බාධා හඳුනාගත හැකිය. මේ තුළ ශ්‍රී ලංකාවේ පවතින දරිද්‍රතාව තව දුරටත් අඩු කර ගැනීමට පිළියම් සම්පාදනය කර ගත හැකි ය. තව ද දරිද්‍රතාව මැනීම සඳහා බහුමාන දරිද්‍රතා දර්ශකය ආදී දර්ශක යොදා ගැනීම තුළ එහි යෝග්‍යතාව පරික්ෂා කිරීමේ දී සිද්ධිසේන හා ජයතිලක 2003 වර්ෂයේ දී ගොඩනඟන ලද බහුමාන දරිද්‍රතා දර්ශකයෙන් ලද ප්‍රතිඵල පිළිබඳව විමසා බැලිය හැකිය. ඒ අනුව එම විශ්ලේෂණයේ ප්‍රතිඵල ලෙස අංශ තුනක් ඉස්මතු කර ගැනීමට හැකි විය. එනම් කුටුම්භයන්ගේ පවත්නා තත්ත්වයේ විචල්‍යතාවන් පැහැදිලි කර ගැනීම, කැලරි පරිභෝජනය සහ අනෙකුත් මූලික අවස්ථා පරිභෝජනය යන ඒවා වේ. මෙලෙස බහුමාන දරිද්‍රතා දර්ශකය තුළින් දරිද්‍රතාවයේ ස්වභාවයන් හඳුනා ගැනීමට එය ඉතාමත් යෝග්‍ය වන බව හඳුනා ගත හැකි ය.

සමාජීය බැහැර කිරීමේ ප්‍රවේශයට අනුව දරිද්‍රතාව මැනීම යෝග්‍ය වන්නේ ශ්‍රී ලංකාවේ පවත්නා සංදර්භය අනුව සමහර සාමාජීය කණ්ඩායම්වල හා ප්‍රජාවන්ගේ දරිද්‍රතාවය හා සම්බන්ධ විවිධ පැතිකඩයන් සාම්ප්‍රදායික ආර්ථික විද්‍යාත්මක විශ්ලේෂණයන් මගින් පැහැදිලි කිරීමට අපහසු නිසා ය (සිල්වා, 2001). මෙම සමාජීය බැහැර කිරීමේ ප්‍රවේශයට අනුව දරිද්‍රතාවය මැනීමේදී යොදා ගන්නේ පැල්පත්, මුඩුක්කුවාසී  අඩු ආදායම් ප්‍රජාවන්, ගම් පුළුල් කිරීමේ ජනපදවාසීන්, සුභසාධන කඳවුරුවල වෙසෙන අවතැන් වූ ප්‍රජාවන් සහ පාරම්පරිකව පැවත එන කුලහීන ජනතාව වැනි ජන කොටස් ය (මායාදුන්නේ සහ රොමේෂන්, 2013). මෙසේ සමාජයෙන් බැහැර වූ ජන කොටස් වල දරිද්‍රතාව මැනීම විශේෂයෙන් ම යෝග්‍ය

වන්නේ බොහෝ දුරට දරිද්‍රතාවය රඳා පවතින්නේ ද මෙම ජන කොටස් කේන්ද්‍ර කර ගනිමින් බැවිණි.

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අතීතයේ පැවති තත්ත්වයට වඩා වර්තමානයේ සුවිශේෂී අඩුවීමක් දක්නට ලැබේ. නමුත් ප්‍රාදේශීය වශයෙන් ගත් කළ අඩු ම දරිද්‍රතාව පවතින කොළඹ දිස්ත්‍රික්කය හා වැඩිම දරිද්‍රතාවක් පවතින මුලතිව් දිස්ත්‍රික්කය අතර දැඩි පරතරයක් දක්නට ලැබෙන අතර, අංශ වශයෙන් ගත්විට 2012/2103 වන විට පෙර වර්ෂයන් සේම වැඩිම දරිද්‍රතාවක් වාර්ථා වන්නේ වතු අංශයෙන් වන අතර, නාගරික දරිද්‍රතාව සුවිශේෂී අඩුවීමක් දක්නට ලැබේ. ලොව සෙසු සංවර්ධනය වෙමින් පවතින රටවලට වඩා ශ්‍රී ලංකාවේ මානුෂික සංවර්ධන අංකය ඉහල අගයක් නිරූපණය වීම තුළ ගම්‍යමාන වන්නේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සෞඛ්‍ය සහ ජීවන තත්වයන් සම්බන්දයෙන් ළඟා කරගෙන ඇති උසස් මට්ටම දරිද්‍රතාවය අඩු කිරීමට දායක වී ඇති බවයි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැනීම උදෙසා නිරපේක්ෂ හා සාපේක්ෂ මිනුම් යොදා ගනු ලබන අතර වර්තමානයේ තවත් විවිධ මානයන් උපයෝගී කරගෙන දරිද්‍රතාව මැනීම සඳහා යොදා ගන්නා ක්‍රම ඉහළ යන බව දක්නට ලැබේ. මේ අනුව සමස්ථයක් ලෙස ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ ස්වභාවය හා තීව්‍රතාව මැනවින් ග්‍රහණය කර ගැනීම සඳහා වන යෝග්‍ය මිනුම් ඉදිරිපත් කොට ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අයි.සී.එම්.එස්.ප්‍රකාශන (2001) "සමෘර්ධි වැඩසටහන" ජයවර්ධන රංජිත්, ආර්ථික විද්‍යා අර්ධ වාර්ෂික අධ්‍යාපන සංග්‍රහය, 2 වන කාණ්ඩය, 3 වන කලාපය, සමුද්‍රදේවී මාවත, නුගේගොඩ.

ජබ්බාර් ශකීලා (2013)"ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ විශ්ලේෂණය 2013", දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2014.

තෙන්නකෝන්. ඩී (2003) )"ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිදුකම අඩුකිරීම සඳහා වූ උපාය මාර්ග හා වැඩසටහන්" ආර්ථික විමසුම (ජනවාරි/මාර්තු).

මල්කාන්ති.එම්.පී.ජී. (2015) "දිළිඳුකම දිළිඳු කිරීම", දෙසතිය ජූලි 2015.

මායාදුන්නේ , රොමේෂන් (2013) "නාගරික දරිද්‍රතාවය මැනීම සඳහා ශ්‍රී ලංකාවේ භාවිතා කරන දරිද්‍රතා මිනුම්වල යෝග්‍යතාව කොළඹ නගරයේ සිද්ධි අධ්‍යනයක් ", කොළඹ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2014, 29 ග්‍රෙගරි පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව.

ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත, 2015 ජූනි.